# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

## இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

## COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

තැ. පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 7. • த. பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 7. • P. O. Box 1431, 36, Malalasekera Mawatha, Colombo 7.
දුරකථන අංක / தொலைபேசி / Telephone: 2596365, 2596360 /1954 ෆැක්ස් / பெக்ஸ் / Fax: 2595045


2025.01.21 මාධ්‍ය නිවේදන අංක: 2025/005/R

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>රු. 500,000/- ක (ලක්ෂ පහක) මුදලක් අල්ලස් වශයෙන් ඉල්ලා ලබාගත් ආගමන විගමන බලයලත් නිලධාරීවරයෙක් අල්ලස් චෝදනා මත අත්අඩංගුවට</u>**

නල්ලූර් උතුර, යාපනය ප්‍රදේශයේ පුද්ගලයෙකු විසින් කරන ලද පැමිණිල්ලකට අනුව වීසා නොමැතිව ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීමේ වරදට අත්අඩංගුවට ගන්නා ලද පැමිණිලිකරු, වැලිසර ආගමන විගමන රැඳවුම් මධ්‍යස්ථානයෙන් නිදහස් කර දීමට අවශ්‍ය කටයුතු කර දීමට රු. 500,000/- ක මුදලක් අල්ලස් වශයෙන් ඉල්ලා ලබා ගැනීමේ චෝදනාව මත ආගමන විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර රැඳවුම් මධ්‍යස්ථානයේ සේවයේ නියුතු ආගමන විගමන බලයලත් නිලධාරීවරයෙක් 2025.01.20 වන දින ප.ව. 4.42 ට පමණ ආගමන විගමන දෙපාර්තමේන්තුවේ වැලිසර රැඳවුම් මධ්‍යස්ථානය තුල දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදී.

අත්අඩංගුවට ගන්නා ලද සැකකරු කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**
0112502672